# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2022.02.15

වර්ෂ 2022 ක් වූ පෙබරවාරි මස 15 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ පෙබරවාරි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
07. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
13. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
14. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
15. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
16. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
17. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ඃ-**

**01. 2022-01-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2022-01-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2022-01-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

(පෙ.ව 09.50 ට ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සහ ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

2022-01-19 දින පැවති මහා සභා රැස්වීම සඳහා තමාගේ සහභාගීත්වය සටහන් වී නොමැති බැවින් මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගි වූ ගරු සභිකවරු යටතට තමාගේ නම ඇතුළත් කර සංශෝධනය කරන ලෙස ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

2022-01-19 දින පැවති මහා සභා රැස්වීම සඳහා තමාගේ සහභාගීත්වය සටහන් වී නොමැති බැවින් මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගි වූ ගරු සභිකවරු යටතට තමාගේ නම ඇතුළත් කර සංශෝධනය කරන ලෙස ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

2022-01-19 දින පැවති මහා සභා රැස්වීම සඳහා මහා සභා රැස්වීම ආරම්භ වූ පසු පැමිණි තමාගේ සහභාගීත්වය මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගි වූ ගරු සභිකවරු යටතට ඇතුළත් කර තිබීම ඉවත්කර සංශෝධනය කරන ලෙස ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

(පෙ.ව 10.20 ට ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

2022-01-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඉහත සංශෝධනවලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

සිට්ට්‍රස් වත්ත ද්විත්ව කුටීර අදාහනාගාරය සහ කලේගාන වෙළඳ සංකීර්ණය යන ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති දෙකම ආරම්භ කොට එහි වැඩකටයුතු කරගෙන යන බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**01.** ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි සන්සයිඩ් වත්ත රජයේ සේවක නිවාස ව්‍යාපෘතියේ මාර්ගයන්, ඇළ මාර්ගය, ක්‍රීඩා පිටිය සහ කාණු අප ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට එකඟතාවය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම සන්සයිඩ් ඉඩම රිචඩ් පතිරණ හිටපු ගරු ඇමතිතුමාගේ මැදිහත්වීමෙන් රජයේ සේවකයන් හට බෙදා දුන් ඉඩම් බවත්, මෙම ඉඩම් සඳහා තක්සේරුවක් සිදු කොට විශාල මුදලක් නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා ගෙන ඇති බවත්, මෙහි ඇතැම් මාර්ගයන් සංවර්ධනය කොට ඇති බවත්, නිවාස සඳහා විදුලි බලයද ලබා දී ඇති නමුත් තවත් විශාල සංවර්ධන වැඩ කොටසක් මෙහි සිදු කිරීමට ඇති බවත්, මෙම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සභාවට විශාල මුදලක් වැය කිරීමට හැකියාවක් නොමැති බැවින්, ඒ සම්බන්ධව ගිවිසුම්ගත වීමට පෙර නිවාස සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කරන ලෙස ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි සන්සයිඩ් වත්ත රජයේ සේවක නිවාස ව්‍යාපෘතියේ මාර්ගයන්, ඇළ මාර්ගය, ක්‍රීඩා පිටිය සහ කාණු අප ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට එකඟතාවය ලබා දීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.** හපුගල ඩාලින්ටන් වත්ත මාර්ගය දෙපස කාණු සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන කැපීමටත්, මාර්ගය දෙපස ගොඩ ගසා ඇති ගල් සහ පස් සභාවේ ට්‍රැක්ටර් රථයක් යොදවා ඉවත් කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව හපුගල ඩාලින්ටන් වත්ත මාර්ගය දෙපස කාණු සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන කැපීමටත්, මාර්ගය දෙපස ගොඩ ගසා ඇති ගල් සහ පස් සභාවේ ට්‍රැක්ටර් රථයක් යොදවා ඉවත් කිරීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**03.** ගාල්ල, බෝපෙ, ශ්‍රී පියරතන පටුමග සහා අරමුදලින් මැන මායිම් ලකුණු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ගාල්ල, බෝපෙ, ශ්‍රී පියරතන පටුමග සහා අරමුදලින් මැන මායිම් ලකුණු කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**04.** අප ප්‍රාදේශීය සභාවේ, කලේගාන ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ ලංකා බැංකුවේ ස්වයංක්‍රීය මුදල් ලබා ගැනීමේ යන්ත්‍රය (ATM) සඳහා කුටියක් ඉදිකිරීමට අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙය දීර්ඝකාලීනව පවත්වා ගෙන යන දෙයක් බවත්, මාර්ග සීමාවන් සඳහා ඉඩ තබා මෙම කටයුත්ත සිදු කරන බවත්, බදු පදනම මත මෙය ලබා දීම සිදු කරන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම ඉදිකිරීම ගාල්ල, වක්වැල්ල, ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදිකිරීම වැදගත් බවත්, ඒ සඳහා වෙනම ප්‍රවේශ මාර්ගයක් ලබා දීම සිදු කළ යුතු බවත්, ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ඉදිකිරීම වක්වැල්ල මාර්ගයට මුහුණලා ඉදිකරන බවත්, ඒ සඳහා ගාල්ල, වක්වැල්ල ප්‍රධාන මාර්ගයෙන් වෙනම ප්‍රවේශයක් ලබා දෙන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාවේ, කලේගාන ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ ලංකා බැංකුවේ ස්වයංක්‍රීය මුදල් ලබා ගැනීමේ යන්ත්‍රය (ATM) සඳහා කුටියක් ඉදිකිරීමට අනුමැතිය ලබා දීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**05.** උත්සව කටයුතු වලදී ප්‍රායෝජනයට ගැනීම සඳහා ප්ලාස්ටික් පුටු 300ක්, බුෆේ සෙට් 06ක්, ආධාරකය සමඟ සින්ක් සෙට් 06, අධාරකය සමඟ වතුර ටැංකි 06ක්, එල් හැඩැති කොඩි කණු 20ක්, සභාවේ නිල ලාංඡනය සහිත වර්ණ කොඩි 20ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ සිදු වන අවමංගල්‍ය උත්සව සඳහා පොදුවේ සියළුදෙනාටම ලබා දීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, මේ සඳහා සේවකයන් දෙදෙනෙක් සහ වාහනයක් යොදවන බවත්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සිදු කරනු ලබන තවත් එක් ප්‍රජා සත්කාරක වැඩසටහනක් ලෙස මෙය සිදු කිරීමට බලාපොරොත්තු වන බවත්, අලාභ හානියක් හෝ භාණ්ඩවල අඩුවක් වුවහොත් අය කර ගැනීමට යටත්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙය ඉතා වැදහත් යෝජනාවක් බවත්, ඒ සඳහා 20x10 ප්‍රමාණයේ සමර්හට් අන්තර්ගතවීම වැදගත් බව ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අවමංගල්‍ය උත්සව සඳහා අත්‍යාවශ්‍යම අංගයක් වන්නේ පාලම් කොඩි බවත්, ස්වේච්ඡා සංවිධානවලින් පාලම් කොඩි නිකුත් කරනු ලබන්නේ එම සංවිධානයේ සාමාජිකයන් සඳහා පමණක් බවත්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ශෝකය යනුවෙන් මුද්‍රණය කරන ලද දිගින් අඩි 15 කින් යුතු පාලම් කොඩි මිලදී ගැනීම සිදු කළ යුතු බවත්, ගරු මන්ත්‍රී ජේ. ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව උත්සව කටයුතු වලදී ප්‍රායෝජනයට ගැනීම සඳහා ප්ලාස්ටික් පුටු 300ක්, බුෆේ සෙට් 06ක්, ආධාරකය සමඟ සින්ක් සෙට් 06, අධාරකය සමඟ වතුර ටැංකි 06ක්, එල් හැඩැති කොඩි කණු 20ක්, සභාවේ නිල ලාංඡනය සහිත වර්ණ කොඩි 20ක් මිලදී ගැනීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**06.** පහත දක්වා ඇති වර්ෂවල ඇස්තමේන්තු ගත මුද්දර ගාස්තු මුදල්, මුද්දර ගාස්තු ගිණුමෙන් ඉවත් කිරීමට යෝජනා කරමි.

| අනු අංකය | වර්ෂය | වටිනාකම |
|---|---|---|
| 01 | 2015 | රු.3,600,000.00 |
| 02 | 2016 | රු.30,000,000.00 |
| 03 | 2017 | රු.3,600,000.00 |
| 04 | 2018 | රු.2,500,000.00 |
| 05 | 2019 | රු.2,500,000.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මුදල් ඇස්තමේන්තුගත කිරීම සිදු කළ නමුත්, මේ වන තුරු සභාව වෙත ලැබී නොමැති බවත්, මෙම මුදල් සභාව වෙත නොලැබෙන බැවින්, පොත් වලින් කපා හැරීමට යෝජනා කළ බවත්, මෙම ආදායම අවුරුදු දෙකක් ඉක්මවූ පසුව නොලැබී යන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව පහත දක්වා ඇති වර්ෂවල ඇස්තමේන්තු ගත මුද්දර ගාස්තු මුදල්, මුද්දර ගාස්තු ගිණුමෙන් ඉවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

| අනු අංකය | වර්ෂය | වටිනාකම |
|---|---|---|
| 01 | 2015 | රු.3,600,000.00 |
| 02 | 2016 | රු.30,000,000.00 |
| 03 | 2017 | රු.3,600,000.00 |
| 04 | 2018 | රු.2,500,000.00 |
| 05 | 2019 | රු.2,500,000.00 |

**07.** හපුගල, නිලදෙණිය පාරේ, පදිංචි එස්.ජේ.ටී. ජාගොඩ මහතාගේ ඉඩම ආසන්නයේ විදුලි රැහැන් නිසා රිසවේෂන් ලෙස වෙන්කොට ඇති පර්චස් 10ක පමණ බිම් කොටස කෘෂිකාර්මික කටයුතු සිදුකිරීම සඳහා එස්.ජේ.ටී. ජාගොඩ මහතා වෙත අවසර ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

නිලදෙණිය ප්‍රදේශයේ අධිබල විදුලි රැහැන් පද්ධතියක් යට මෙම ඉඩම පිහිටා ඇති බවත්, අවට ප්‍රදේශවාසීන් මෙම ඉඩම කුණු දැමීම සඳහා භාවිතා කරන බවත්, මෙම ජාගොඩ මහතා විසින් සභාව වෙතින් මෙම ඉඩම වගා කටයුතු සිදු කිරීම සඳහා ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කොට ඇති බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මේ සඳහා ඇති නිවැරදි ක්‍රමයට මෙම යෝජනාව ක්‍රියාත්මක කරන ලෙසත්, එසේ නොමැතිනම් මෙම යෝජනාව සඳහා තමා විරුද්ධ බවත්, එම නිසා මෙම යෝජනාව සංශෝධනය කර ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

සභාවේ අනුමැතියට යටත්ව මෙම ඉඩම ලබා දෙන බැවින්, ඒ සඳහා තක්සේරුවක් සිදු කරන ලෙස ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

මෙම ඉඩම නොමිලේ ලබා නොදෙන බවත්, බදු පදනම යටතේ සභාව තීරණය කරනු ලබන මුදලක් ගෙවා එය ලබා ගැනීමට ජාගොඩ මහතා කැමති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

වසරින් වසර අළුත්වන බදු ගිවිසුමකට යන ලෙසත්, ඒ සඳහා තක්සේරුවක් සිදු කරන ලෙසත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

වගා කටයුතු සඳහා මෙම ඉඩම බදු දෙන බැවින්, වසර තුනකට වරක් මෙම බදු ගිවිසුම අලුත්වන පරිදි සකස් කරන ලෙස ගරු මන්ත්‍රී ජේ. ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

හපුගල, නිලදෙණිය පාරේ, පදිංචි එස්.ජේ.ටී. ජාගොඩ මහතාගේ ඉඩම ආසන්නයේ විදුලි රැහැන් නිසා රිසවේෂන් ලෙස වෙන්කොට ඇති පර්චස් 10ක පමණ බිම් කොටස වසර තුනකට වරක් අළුත් කරන බදු ගිවිසුමකට යටත්ව කෘෂිකාර්මික කටයුතු සිදුකිරීම සඳහා එස්.ජේ.ටී. ජාගොඩ මහතා වෙත අවසර ලබා දීමට ලෙස මෙම යෝජනාව සඳහා සංශෝධනයක් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

එම සංශෝධනය ගරු මන්ත්‍රී ජේ. ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී සංශෝධිත යෝජනාවට අදාළව හපුගල, නිලදෙණිය පාරේ, පදිංචි එස්.ජේ.ටී. ජාගොඩ මහතාගේ ඉඩම ආසන්නයේ විදුලි රැහැන් නිසා රිසවේෂන් ලෙස වෙන්කොට ඇති පර්චස් 10ක පමණ බිම් කොටස වසර තුනකට වරක් අළුත් කරන බදු ගිවිසුමකට යටත්ව කෘෂිකාර්මික කටයුතු සිදුකිරීම සඳහා එස්.ජේ.ටී. ජාගොඩ මහතා වෙත අවසර ලබා දීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**08.** කිතුලම්පිටිය, උඩුමුල්ල පාරේ ඇති අනතුරුදායක හික් ගස සහා අරමුදලෙන් කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ. ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ගස මාර්ගයට සහ ඒ ආසන්නයේ ඇති වෙනත් ඉඩමකට මායිම්ව පිහිටා ඇති බවත්, එම ඉඩමේ හිමිකරු ලෙස මෙම ගස කපා ඉවත් කිරීමට කැමති බවත්, මෙම ගසා කපා දැමීමෙන් පසු මෙම ස්ථානයේ තැබීම ගැටළුකාරි තත්ත්වයක් බවත්, මාර්ගය අඩි හයක පමණ පළල ඇති බැවින්, මෙම ගස කපා එම ස්ථානයෙන් ඉවත් කරන ලෙස ගරු මන්ත්‍රී ජේ. ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කිතුලම්පිටිය, උඩුමුල්ල පාරේ ඇති අනතුරුදායක හික් ගස සහා අරමුදලෙන් කපා ඉවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**09.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122, 123 හා 126 වගන්තිය යටතේ පීඩාකාරි හෝ අනතුරුදායක යැයි ප්‍රාදේශීය සභාව විසින් සලකනු ලබන වෙළඳාම් විධිමත් කිරීම, අධීක්ෂණය, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීමට අතුරු ව්‍යවස්ථා සකස්කිරීමටත්, එම අතුරු ව්‍යවස්ථා සකස්කිරීම සඳහා සභා බලතල අනුව අංක 126 වගන්තියට අදාළ ක්ෂේත්‍ර හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා සම්පාදනය සහ උපදෙස් ලබා දීම සඳහා පහත දක්වා ඇති සමාජිකයන්ගෙන් සමන්විත අතුරු ව්‍යවස්ථා කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

I. ගරු සභාපතිතුමා
II. ලේකම්
III. විමර්ශන නිලධාරි
IV. ආදායම් පරීක්ෂක

V. පරිසර නිලධාරි
VI. පරිසර විෂය නිලධාරි
VII. තාක්ෂණ නිලධාරි
VIII. ශ්‍රී ලංකා පොලීසිය
IX. ප්‍රජා සංවර්ධන නිලධාරි
X. ගරු සභිකවරු දෙදෙනෙක්

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභිකවරු දෙදෙනෙක් යන අංගය අංක දෙකට සඳහන් විය යුතු බව ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122, 123 හා 126 වගන්තිය යටතේ පීඩාකාරි හෝ අනතුරුදායක යැයි ප්‍රාදේශීය සභාව විසින් සලකනු ලබන වෙළඳාම් විධිමත් කිරීම, අධීක්ෂණය, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීමට අතුරු ව්‍යවස්ථා සකස්කිරීමටත්, එම අතුරු ව්‍යවස්ථා සකස්කිරීම සඳහා සභා බලතල අනුව අංක 126 වගන්තියට අදාළ ක්ෂේත්‍ර හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා සම්පාදනය සහ උපදෙස් ලබා දීම සඳහා පහත දක්වා ඇති සමාජිකයන්ගෙන් සමන්විත අතුරු ව්‍යවස්ථා කමිටුවක් පත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

I. ගරු සභාපතිතුමා
II ලේකම්
III. විමර්ශන නිලධාරි
IV. ආදායම් පරීක්ෂක
V. පරිසර නිලධාරි
VI. පරිසර විෂය නිලධාරි
VII. තාක්ෂණ නිලධාරි
VIII. ශ්‍රී ලංකා පොලීසිය
IX. ප්‍රජා සංවර්ධන නිලධාරි
X. ගරු සභිකවරු දෙදෙනෙක්

**10.** අප ප්‍රාදේශීය සභාවට නවක පත්වීම් ලබා පැමිණි සංවර්ධන නිලධාරිනියන් හට කාර්යාල මේස දෙකක් සහ පුටු දෙකක් මිලදී ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාවට නවක පත්වීම් ලබා පැමිණි සංවර්ධන නිලධාරිනියන් හට කාර්යාල මේස දෙකක් සහ පුටු දෙකක් මිලදී ගැනීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**11.** සිට්‍රස් වත්තේ ඉදිකරමින් පවතින ද්විත්ව කුටීර ආදාහනාගාරයේ වැඩ කටයුතු සඳහා කාර්යය මණ්ඩලය අනුමතවන තෙක් කොන්ත්‍රාත් පදනම මත කම්කරුවන් හතර දෙනෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු සිදු කර ගෙන යන බැවින්, එය ඉදිකරන ආකාරය නිරීක්ෂණය කිරීම පසුකාලයකදී අළුත්වැඩියා කටයුතු සිදු කිරීමේදී සේවකයන් හට පහසුවන බවත්, සුළු අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට එය අත්වැලක් වන බවත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මේ සඳහා අනුමැතිය ලබා ගැනීමට බලාපොරොත්තු වන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාවට තමා විරුද්ධ බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව බහුතරයෙන් සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව සිට්ට්‍රස් වත්තේ ඉදිකරමින් පවතින ද්විත්ව කුටීර ආදාහනාගාරයේ වැඩ කටයුතු සඳහා කාර්යය මණ්ඩලය අනුමතවන තෙක් කොන්ත්‍රාත් පදනම මත කම්කරුවන් හතර දෙනෙකු බඳවා ගැනීමට මහා සභාව විසින් බහුතරයෙන් සභා සම්මත කරන ලදී.

**12.** මීපාවල උපකාර්යාලයේ කාර්ය මණ්ඩලයේ භාවිතය සඳහා වැසිකිලියක් ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

උප කාර්යාලය සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති නමුත්, මේ වන තෙක් එය ඉටු වී නැති බවට ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

A4 ප්‍රමාණයේ ඡායා පිටපත් ලබා ගත හැකි ඡායා පිටපත් යන්ත්‍රයක් උප කාර්යාලයේ ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කුඩා ප්‍රමාණයේ ප්‍රින්ටර් යන්ත්‍රයක් උප කාර්යාලයේ ඇති නමුත්, එය ප්‍රමාණවත් නොවන බවට ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

උප කාර්යාලයේ තාක්ෂණ නිලධාරිණියට සහ අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ක්ෂේත්‍ර කටයුතු සඳහා සභාවේ වාහනයක් යොදවන ලෙස තමා විසින් සභාවට යෝජනාවක් සිදු කළ බවත්, ඒ සඳහා සතියකට වරක් හෝ වාහනයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පරිවර්තිත ගමන් වියදම් දීමනාව ලබා දෙන බවත්, කණ්ඩායමක් ලෙස ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන අවස්ථාවලදී සභාවේ වාහන ලබා දෙන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව මීපාවල උපකාර්යාලයේ කාර්ය මණ්ඩලයේ භාවිතය සඳහා වැසිකිලියක් ඉදිකිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**13.** අප ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග හා විදුලි කණු ලේඛන ගත කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයන් පස් දෙනෙකු බඳවා ගැනීමටත්, ටැබ් යන්ත්‍ර දෙකක් මිලදී ගැනීමටත්, ඩෙස්ක්ටොප් වර්ගයේ පරිගණකයක් මිලදී ගැනීමටත්, කුලී පදනම මත මෝටර් බයිසිකල් දෙකක් ලබා ගැනීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙය පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් මත සිදු කරන ලද යෝජනාවක් බවත්, මෙම බඳවා ගැනීම් මෙම කාර්යය සඳහා පමණක් සිදු කරන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

වසර දහයක පමණ කාලයක සිට මෙම යෝජනාව ඉදිරිපත් කොට ඇති බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

හෙල්ප් - ඕ රාජ්‍ය නොවන සංවිධානය හරහා අලුතෙන් ඇප් එකක් හඳුන්වා දී ඇති බවත්, එමඟින් ප්‍රාදේශීය සභාව වෙත පැමිණිලි ලබා දීම සිදු කළ හැකි බවත්, ඒ සඳහා ඇති අවශ්‍යතාවය නිසා මෙම යෝජනාව ක්‍රියාත්මක කරන බවත්, නවීන තාක්ෂණය භාවිතා කරමින් සිදු කරනු ලබන මෙම වැඩපිළිවෙල සඳහා තාක්ෂණ විද්‍යාලවලින් සිසුන් බඳවා ගැනීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග හා විදුලි කණු ලේඛන ගත කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයන් පස් දෙනෙකු බඳවා ගැනීමටත්, ටැබ් යන්ත්‍ර දෙකක් මිලදී ගැනීමටත්, ඩෙස්ක්ටොප් වර්ගයේ පරිගණකයක් මිලදී ගැනීමටත්, කුලී පදනම මත මෝටර් බයිසිකල් දෙකක් ලබා ගැනීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**14.** උක්වත්ත බටහිර ග්‍රාම නිලධාරී වසමේ අංක 137, හේනවත්ත, උක්වත්ත, ගාල්ල යන ස්ථානයේ පදිංචි එම්.එන්.එෆ්. පසීලා මහත්මියගේ නිවස ආසන්නයේ කණ්ඩිය නායයාම නිසා එම මහත්මියගේ නිවසට යන කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කර ඇති මාර්ගය මේ වන විට අස්ථාවර තත්ත්වයේ සහ අවදානම් තත්ත්වයේ ඇති බැවින් මාර්ගයේ අවසන් කොටස කඩා ඉවත් කොට කණ්ඩිය කපා අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම අනතුරුදායක ස්ථානය තමා සමඟ ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමා විසින් නිරීක්ෂණය කළ බවත්, එම ප්‍රශ්නය පිළිබඳව ඒ මොහොතේම සභාපතිතුමාව දැනුවත් කළ බවත්, මෙම ප්‍රශ්නය න්‍යාය පත්‍රයට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට වඩා අනතුරුදායක තත්ත්වයක් තිබූ හෙයින් මෙය මීට පෙර සිදු කිරීමට තිබූ කාරණාවක් බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභාවේ ඇති ගැටළුකාරී තත්ත්වයන් නිසා මෙම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කළ බවත්, මෙම කාරණය ඉටු කිරීම මාසයක් ප්‍රමාද කිරීම පිළිබඳව තමා විසින් කණගාටු වන බවත්, සභාවේ අනුමැතියකින් තොරව මෙම මාර්ගය කඩා ඉවත් කරා නම් මහජන බදු මුදලින් සංවර්ධනය කරන ලද මාර්ගයක් කඩා ඉවත් කළා යනුවෙන් ගැටළු ඇති වන බැවින් මෙම යෝජනාව න්‍යාය පත්‍රයට යොදා සභාවේ අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම කණ්ඩියේ කොටසක් කඩා වැටී නිවසේ පැත්තකට හානි සිදු වී ඇති බැවින්, මේ සම්බන්ධව වහාම සභාව මැදිහත් වී ක්‍රියාමාර්ග ගැනීමට තිබුණ බවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමාද මෙම ස්ථානය නිරීක්ෂණය කර තිබු ණ බවත්, මෙම ස්ථානය තමා විසින්ද නිරීක්ෂණය කළ බවත්, ගරු සභාපතිතුමාද මෙම කාර්යය සිදු කළ යුතුය යන මතයේ සිටි බවට ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව සභාවේ විරෝධතාවයක් නොමැති බවට දැනුම් දීම, ප්‍රමාණවත් බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** ඃ- එකී යෝජනාවට අදාළව උක්වත්ත බටහිර ග්‍රාම නිලධාරී වසමේ අංක 137, හේනවත්ත, උක්වත්ත, ගාල්ල යන ස්ථානයේ පදිංචි එම්.එන්.එෆ්. පසීලා මහත්මියගේ නිවස ආසන්නයේ කණ්ඩිය නායයාම නිසා එම මහත්මියගේ නිවසට යන කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කර ඇති මාර්ගය මේ වන විට අස්ථාවර තත්ත්වයේ සහ අවදානම් තත්ත්වයේ ඇති බැවින් මාර්ගයේ අවසන් කොටස කඩා ඉවත් කොට කණ්ඩිය කපා අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**15.** 2021-12-31 දිනට අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** ඃ- එකී යෝජනාවට අදාළව 2021-12-31 දිනට අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**16.** මහින්ද බන්දුල හල්කෙවෙල මහතා විසින් 1982-09-05 දින ලියා සහතික කරන ලද අංක 111 දරණ ඔප්පුවට අනුව බලයලත් මිනින්දෝරු එච්.එල්.ආර්. ජයසුන්දර මහතා විසින් 2020-04-23 දින මැන සකස් කරන ලද පිඹුරුපත් අංක 5505 දරණ පිඹුරේ කැබලි අංක 01 සිට 10 දක්වා (අක්. 01 රූඩ්. 00 පර්. 03) ලෙස නිරූපිත ගාල්ල, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලබුදූව ගොවිජන සේවා බල ප්‍රදේශයේ, බෝපෙ උතුර ග්‍රාම නිලධාරී වසමේ "පරගහ ඕවිට හෙවත් දික්ඕවිට" නැමැති බිම් කොටස කෘෂිකාර්මික ගොඩ ඉඩම් නාම ලේඛනයට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා ඉඩමෙහි පිහිටා ඇති අඩි 04ක් පළල කාණු පද්ධතියට අදාළ රක්ෂිත සීමාව එක් පසෙකින් අඩි 06ක් බැගින් වෙන් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගොවිජන සේවා ආයතනය විසින් මේ සඳහා සභාවේ නිර්දේශ ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම අනුව, මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, ඒ සඳහා කාණුවේ එක් පසෙකින් අඩි 06 බැගින් රිසවේෂන් තැබීමට යෝජනා කළ බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

පහත් බිමක් සංවර්ධනය කොට වෙන්දේසි කර ඇති බවත්, මෙම කාණුව හරස්කොට අනවසර ඉදිකිරීම් සිදු කරන බවත්, මේ සම්බන්ධව ගොවිජන සේවා ආයතනයේ මැදිහත්වීම අගය කරන බවත් ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව මහින්ද බන්දුල හල්කෙවෙල මහතා විසින් 1982-09-05 දින ලියා සහතික කරන ලද අංක 111 දරණ ඔප්පුවට අනුව බලයලත් මිනින්දෝරු එච්.එල්.ආර්. ජයසුන්දර මහතා විසින් 2020-04-23 දින මැන සකස් කරන ලද පිඹුරුපත් අංක 5505 දරණ පිඹුරේ කැබලි අංක 01 සිට 10 දක්වා (අක්. 01 රූඩ්. 00 පර්. 03) ලෙස නිරූපිත ගාල්ල, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලබුදූව ගොවිජන සේවා බල ප්‍රදේශයේ, බෝපෙ උතුර ග්‍රාම නිලධාරි වසමේ "පරගහ ඕවිට හෙවත් දික්ඕවිට" නැමැති බිම් කොටස කෘෂිකාර්මික ගොඩ ඉඩම් නාම ලේඛනයට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා ඉඩමෙහි පිහිටා ඇති අඩි 04ක් පළල කාණු පද්ධතියට අදාළ රක්ෂිත සීමාව එක් පසෙකින් අඩි 06ක් බැගින් වෙන් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**17.** අප ප්‍රාදේශීය සභාවට අයත් සහ අප ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කරනු ලබන මාර්ග දෙපස සහ කාණුවල පවිත්‍රතා කටයුතු සඳහා මිල ගණන් කැඳවා පෞද්ගලික අංශයේ මෙම සේවාවන් සපයනු ලබන ආයතන හරහා සිදු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සමස්ථයක් වශයෙන් ගත් විට මාර්ග දෙපස පවිත්‍රතා කටයුතු ඉෂ්ට නොවන බවත්, මුර රාජකාරි පෞද්ගලික අංශයට ලබාදීම සාර්ථක වී ඇති බවත්, ප්‍රීමික්ස් ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවත්, සභාව සතු ඉඩම්වල වැටවල් ඉදිකිරීම, සභාව සතු භාණ්ඩ හා උපකරණ වල සේවා කටයුතු සිදු කිරීමට දැනට සිටින සේවකයන් යෙදවීමට බලාපොරොත්තු වන බවත්, තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ මාර්ග දෙපස පවිත්‍රතා කටයුතු ටෙන්ඩර් කොට පෞද්ගලික අංශය හරහා සිදු කිරීමට බලාපොරොත්තු වන බවත්, මාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ඉතාමත් සාර්ථක ලෙස මෙම කාර්යය සිදු කර ගෙන යන බවත්, සේවකයන්ගේ වැඩ හා හැසිරීම පිළිබඳව තමා වෙත චෝදනා එල්ල වන බැවින්, මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම යෝජනාව මීට පෙර සභා වාරයකදී තමා විසින් ඉදිරිපත් කරන ලද චෝදනාවක් බවත්, අනියම් කම්කරුවන් විසින් කරනු ලබන සේවාවන් සහ පෞද්ගලික අංශයේ සේවකයන් විසින් සිදු කරනු ලබන සේවාවන් සංසන්දනය කළ විට සභාවට පාඩුදායක තත්ත්වයක් ඇති බවත්, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත්, කිතුලම්පිටිය ආනන්ද මාවතේ තණකොළ කැපීම සඳහා එක් කම්කරුවෙක් පමණක් පැමිණෙන බවත්, කිලෝ මීටර් 1.7 ක් දිග මාර්ගයේ දෙපස තණකොළ එක් පුද්ගලයෙකු විසින් දින දෙකකදී කපා අවසන් කරන බවත්, වැසි සහිත කාලගුණ තත්ත්වලදී සභාවේ සේවකයන්ගෙන් සේවය ලබා ගැනීමට නොහැකි නමුත් පෞද්ගලික අංශයෙන් සේවය ලබා ගත හැකි බවත්, පෞද්ගලික අංශයෙන් මෙම සේවාව ලබා ගැනීමේදී තාක්ෂණ නිලධාරීන් හරහා මාර්ගයේ පවිත්‍රතා කටයුතු අධීක්ෂණය කිරීම ප්‍රමාණවත් බවත්, කාණු සුද්ධ කිරීම සඳහා පෞද්ගලික අංශයෙන් සේවාව ලබා ගත නොහැකි බවත්, ගරු මන්ත්‍රී ජේ. ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කාණු සුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු සභාවේ කම්කරුවන් හරහා සිදු කිරීමට බලාපොරොත්තු වන බවත්, ඍජු ශ්‍රමික පදනම යටතේ සංවර්ධන කටයුතු සිදු කිරීමට ඉදිරියේදී බලාපොරොත්තු වන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සභාව ලෙස මෙවැනි කාර්යයක් සිදු කිරීමට යෝජනා කිරීම පිළිබඳව තමා අගය කරන බවත්, මෙම යෝජනාව කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙසත් ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාවට අයත් සහ අප ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කරනු ලබන මාර්ග දෙපස සහ කාණුවල පවිත්‍රතා කටයුතු සඳහා මිල ගණන් කැඳවා පෞද්ගලික අංශයේ මෙම සේවාවන් සපයනු ලබන ආයතන හරහා සිදු කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**18.** හපුගල සුසාන භූමියේ අවට නිවාස වලට අනතුරුදායක ලෙස පිහිටා ඇති හික් ගස සහා අරමුදලෙන් කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව හපුගල සුසාන භූමියේ අවට නිවාස වලට අනතුරුදායක ලෙස පිහිටා ඇති හික් ගස සභා අරමුදලෙන් කපා ඉවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**(පෙ.ව 11.00ට තේ පානය සඳහා සභාව කල් තබන ලද මහා සභා රැස්වීම පෙ.ව 11.15ට නැවත ආරම්භ කරන ලදී.)**

(පෙ.ව 11.05 ට ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සහ ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා මහා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා**

**19.** කරාපිටිය කොට්ඨාශයේ කසළ ගැටළුව විසඳීමට අවශ්‍ය කසළ බඳුන් බෙදාදීමට සූදානම් කර ඇති වැඩපිළිවෙලට අවශ්‍ය පහසුකම් සැලසීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී කේ. යූ. පී. යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා ප්‍රවාහන පහසුකම් සලසා දෙන ලෙස ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

මේ සඳහා ප්ලාස්ටික් කසළ බඳුන් මිලදී ගැනීමෙන් වළකින ලෙස ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කරාපිටිය කොට්ඨාශය පුරා දිරන කසළ සභාව මගින් එකතු කිරීම නැවැත්වීම අරමුණු කොට ගෙන මෙම යෝජනාව ක්‍රියාත්මක කරන බව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කරාපිටිය කොට්ඨාශයේ කසළ ගැටළුව විසඳීමට අවශ්‍ය කසළ බඳුන් බෙදාදීමට සූදානම් කර ඇති වැඩපිළිවෙලට අවශ්‍ය පහසුකම් සැලසීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**20.** කරාපිටිය, උළුවිටිකේ මාර්ගය සංවර්ධනය කිරීමේදී සම සෞඛ්‍ය විද්‍යාපීඨය අසළ අවහිර වී ඇති බෝක්කුව සංවර්ධනය කරන ලෙසට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යැවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම සිදු කරන නමුත් මෙම බෝක්කුව, කාණු පද්ධති සංවර්ධනය කිරීම එම ඇස්තමේන්තුවට ඇතුළත් නොමැති බැවින්, මෙම යෝජනාව සිදු කළ බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කරාපිටිය, උළුවිටිකේ මාර්ගය සංවර්ධනය කිරීමේදී සම සෞඛ්‍ය විද්‍යාපීඨය අසළ අවහිර වී ඇති බෝක්කුව සංවර්ධනය කරන ලෙසට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යැවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**21.** දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සංවර්ධනය කරන ලද ගොඩකන්ද මාර්ගයේ ත්‍රීරෝද රථ මන්තීරුව වෙන්කර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස දන්වා යැවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ස්ථානයේ කොපමණ ත්‍රීරෝද රථ ප්‍රමාණයක් ගාල් කළ හැකි ත්‍රීරෝද රථ මංතීරුවක් ඉදිකරන්නේද යනුවෙන් ප්‍රශ්න කරන ලද ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් මෙම ත්‍රීරෝද රථ මාර්ගයේ දිගට නවතා තැබීම නිසා මාර්ගයේ ගමනා ගමන කටයුතු වලට අවහිරතා මතුවෙන බවත්, නිශ්චිත ත්‍රී රෝද රථ සංඛ්‍යාවක් එක් වරකට නවතා තැබිය හැකි වන පරිදි අවශ්‍ය කටයුතු සකස් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

දැනට මෙම ස්ථානයේ ත්‍රීරෝද රථ 37 ක් ඇති බවත්, මාර්ග සංවර්ධන අධිකාරිය මෙම ත්‍රීරෝද රථ මංතීරුව වෙන් කිරීම සිදු කර ඇති නමුත්, මෙම මාර්ගය සංවර්ධනය කිරීමෙන් පසු ගමනාගමන කටයුතු වලට අවහිරතා මතු වී ඇති බවත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ః-** එකී යෝජනාවට අදාළව දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සංවර්ධනය කරන ලද ගොඩකන්ද මාර්ගයේ ත්‍රීරෝද රථ මන්තීරුව වෙන්කර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස දන්වා යැවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**22.** කරාපිටිය ග්‍රාම නිලධාරි වසම සඳහා සේවා පියසක් ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා අමරසේන මහතා විසින් භූමිය ලබා දීමට එකඟතාවය ලබා දී ඇති බවට ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම ස්ථානයේ සේවා පියස ඉදිකිරීමට තමා විසින්ද අදහස් කර ඇති බවට, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ః-** එකී යෝජනාවට අදාළව කරාපිටිය ග්‍රාම නිලධාරි වසම සඳහා සේවා පියසක් ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**23.** කරාපිටිය, ඉන්ග්ලන්ඩ් හිල් මාර්ගයේ පැති කාණුව ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කිරිමැටිමුල්ල මාර්ගය සහ ඉන්ග්ලන්ඩ් හිල් මාර්ගය සම්බන්ධ වන ස්ථානයේ පැති කාණුව සංවර්ධනය කිරීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ః-** එකී යෝජනාවට අදාළව කරාපිටිය, ඉන්ග්ලන්ඩ් හිල් මාර්ගයේ පැති කාණුව ඉදිකිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**24.** ජස්ටින් කන්ද, සන්ටෙල් දුරකථන කුළුණ මාර්ගය දැඩි අවදානම් තත්ත්වයකට පත්ව ඇති බැවින් ඉදිරියේදී සිදුවිය හැකි අනතුරු වැලැක්වීම සඳහා අනතුරුදායක ස්ථානය මගහැර යා හැකි පරිදි මාර්ගය වෙනස් කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එකඟතාවය ලබාගෙන සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යෙදවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ජස්ටින් කන්ද, සන්ටෙල් දුරකථන කුළුණ මාර්ගය දැඩි අවදානම් තත්ත්වයකට පත්ව ඇති බැවින් ඉදිරියේදී සිදුවිය හැකි අනතුරු වැලැක්වීම සඳහා අනතුරුදායක ස්ථානය මගහැර යා හැකි පරිදි මාර්ගය වෙනස් කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එකඟතාවය ලබාගෙන සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යෙදවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**25.** කරාපිටිය ඉන්ග්ලන්ඩ් හිල් ඉඩමේ කොටසක් සේවා පියසක් ඉදිකිරීම සඳහා මැනුම් කටයුතු සිදුකර ලබා ගැනීමටත්, එම ලබා ගන්නා බිම් ප්‍රමාණය පිළිබඳව ඉඩම් හිමියාට ලිපියක් නිකුත් කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කරාපිටිය ඉන්ග්ලන්ඩ් හිල් ඉඩමේ කොටසක් සේවා පියසක් ඉදිකිරීම සඳහා මැනුම් කටයුතු සිදුකර ලබා ගැනීමටත්, එම ලබා ගන්නා බිම් ප්‍රමාණය පිළිබඳව ඉඩම් හිමියාට ලිපියක් නිකුත් කිරීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**26.** සභා වාර්තාව සංක්ෂිප්ත කිරීම හේතුවෙන් මහජන නියෝජිතයන් දක්වන අදහස් නැවත පරීක්ෂා කිරීමේදී විශාල ගැටළුවලට මුහුණ දෙන බැවින් සභා රැස්වීමේ පටිගත කරන ලද හඬ පටය සියළුම සභිකවරුන් වෙත සී.ඩී. තැටියකට අන්තර්ගත කොට ලබා දෙන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මහා සභා රැස්වීමේ පටිගත කරන ලද හඬ පටය අවශ්‍ය ගරු සභිකවරු පෙන් ඩ්‍රයිව් එකක් ලබා දී එය ලබා ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව සභා වාර්තාව සංක්ෂිප්ත කිරීම හේතුවෙන් මහජන නියෝජිතයන් දක්වන අදහස් නැවත පරීක්ෂා කිරීමේදී විශාල ගැටළුවලට මුහුණ දෙන බැවින් සභා රැස්වීමේ පටිගත කරන ලද හඬ පටය සියළුම සභිකවරුන් වෙත සී.ඩී. තැටියකට අන්තර්ගත කොට ලබා දෙන මෙන් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**27.** හිරිඹුර, ගැමුණු මාවතේ පොදු ළිඳ පිහිටි භූමිය තුළ ප්‍රජා කටයුතු සඳහා ප්‍රජා ශාලාවක් ඉදිකිරීමටත්, කඩ කාමර දෙකක් ඉදිකොට බදු දීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ඉඩම සම්බන්ධව සභාවට ඇති අයිතිය තහවුරු කර ගැනීම ගැටලුකාරි තත්ත්වයක් ඇති බවත්, කම්බි වැටකින් මෙම ඉඩම ආවරණය කළද එම කම්බි වැට කඩා දමන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම ස්ථානයේ පර්චස් හතරකට ආසන්න බිම් ප්‍රමාණයක් ඇති බැවින්, මෙම ඉඩමේ පත්තිරුව සොයා ගැනීමේ වැඩපිළිවෙලකට යා යුතු බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම ස්ථානයේ කටු කම්බි වැටක් ගසා සභාවට හිමිවිය යුතු බිම් ප්‍රමාණය වෙන් කර ගත යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම ළිඳ ප්‍රතිසංස්කරණය කරන ලෙස සභා යෝජනාවක් ලබා ගෙන ඇති බැවින්, එම ළිඳ නැවත භාරා සකස් කිරීමට හැකියාවක් ඇති බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව හිරිඹුර, ගැමුණු මාවතේ පොදු ළිඳ පිහිටි භූමිය තුළ ප්‍රජා කටයුතු සඳහා ප්‍රජා ශාලාවක් ඉදිකිරීමටත්, කඩ කාමර දෙකක් ඉදිකොට බදු දීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(පෙ.ව 11.35 ට ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා මහා සභා රැස්වීමට සහභාගි වීම සිදුවිය.)

<u>**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා**</u>

**28.** පියදිගම, වාලුකාරාම පන්සල අසළ රසිකා මහත්මියගේ සහ තවත් නිවාස හයකට යන මාර්ගය කොරිපස් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පසුගිය මාසයේදී මෙම මාර්ගයේ ඇති කාණුවක් සඳහා සිලින්ඩර් යොදා සංවර්ධනය කර දෙන ලෙස යෝජනා කළ නමුත්, සභාවේ ජේ.සී.බී. යන්ත්‍රය හෝ ට්‍රැක්ටර් රථ ගමන් කිරීමට නොහැකි වීම හේතුවෙන් එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව පියදිගම, වාලුකාරාම පන්සල අසළ රසිකා මහත්මියගේ සහ තවත් නිවාස හයකට යන මාර්ගය කොරිපස් යොදා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**29.** ඇළබඩ සන්බීම් පාර්ක් දෙවන පටුමග සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගය බොහෝ පිරිසක් භාවිතා කරනු ලබන මාර්ගයක් වන බැවින්, සභාවේ ජේ.සී.බී. යන්ත්‍රය යොදා ගෙන මෙම මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කළ බවට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ඇළබඩ සන්බීම් පාර්ක් දෙවන පටුමග සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**30.** එගොඩකනත්ත ප්‍රජා ශාලාව දෙමහල් ප්‍රජා ශාලාවක් ලෙස ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සංවර්ධනය කිරීමට යෝජිත බැවින් එම ඉඩම සභා අරමුදලින් මැන මායිම් ලකුණු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ඉඩම සම්බන්ධව මායිම් ප්‍රශ්න ඇති බැවින්, මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙවැනි ගැටලු කිහිපයක්ම මේ වන විට පැන නැගී ඇති බැවින් අදාළ ව්‍යාපෘතියට වෙන් වූ ප්‍රතිපාදනවලින් සභාවේ අධීක්ෂණය යටතේ මෙම ඉඩම මැන මායිම් ලකුණු කිරීම සුදුසු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම ඉඩමේ අයිතිය සභාව සතු බැවින්, මෙම ඉඩම මැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපත් නොවන බවත්, වැසිකිළි වලක් මෙම ඉඩම තුළ ඇති බැවින්, එය ඉවත් කිරීමට ඇති අවශ්‍යතාවය නිසා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

දැනට තිබෙන මායිම් අනුව මෙම කාර්යය සිදු කරන ලෙසත්, ඉඩම මැනීමේ කටයුතු සිදු කළ පසු වැසිකිළි වල ඉඩම තුළ පිහිටා තිබුණහොත් එය ඉවත් කිරීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට සිදු වන බවත්, එම නිසා සභාවේ තාක්ෂණ නිලධාරීන් මඟින් ඉඩමේ මායිම් පෙන්වීම සුදුසු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව එගොඩකනත්ත ප්‍රජා ශාලාව දෙමහල් ප්‍රජා ශාලාවක් ලෙස ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සංවර්ධනය කිරීමට යෝජිත බැවින් එම ඉඩම සහා අරමුදලින් මැන මායිම් ලකුණු කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**31.** රත්නගිරිවත්ත, ව්‍යාපෘති මාර්ගයේ ඩී.එම්. නිශාන්ත මහතාගේ ඉඩමට මායිම්ව රජයේ රක්ෂිත කොටසේ අවට නිවාස වලට අනතුරුදායක ලෙස පිහිටා ඇති කොස් ගස, ඇට්ටෝනියා ගස සහ අඹ ගස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කොට සභා අරමුදලින් කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ. ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්. එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ගස්වලින් අවට නිවාසවලට අනතුරුදායක තත්ත්වයක් ඇති බැවින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවසරය ලබා ගෙන මෙම ගස් කැපීම සිදු කළ යුතු බවට ගරු මන්ත්‍රී ජේ. ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් සිදු කොට මේ සඳහා එකඟතාවය ලබා ගෙන අදාළ අනතුරුදායක ගස් කපා වෙන්දේසි කොට කැපුම් වියදම ලබා ගත යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

රත්නගිරි වත්තේ පිහිටි මෙම ඉඩමට අදාළ පිඹුරේ අංක 17 ලෙස නම් කොට ඇත්තේ අනතුරුදායක තත්ත්වය ඇති නිවාසය බවත්, අංක 15 ලෙස නම් කොට ඇත්තේ රිසවේෂන් සඳහා වෙන් කොට ඇති ඉඩම බවත් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමේ පහසුව උදෙසා මෙම පිඹුර සභා ගත කරන බවට ගරු මන්ත්‍රී ජේ. ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව රත්නගිරිවත්ත, ව්‍යාපෘති මාර්ගයේ ඩී.එම්. නිශාන්ත මහතාගේ ඉඩමට මායිම්ව රජයේ රක්ෂිත කොටසේ අවට නිවාස වලට අනතුරුදායක ලෙස පිහිටා ඇති කොස් ගස, ඇට්ටෝනියා ගස සහ අඹ ගස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කොට සභා අරමුදලින් කපා ඉවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා ඃ-</u>**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ඃ-**

**I.** 2022-01-20 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-**

**I.** 2022-01-20 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

**<u>01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

2022 වර්ෂයේ ජනවාරි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 වර්ෂයේ ජනවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

2022 වර්ෂයේ ජනවාරි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ඉදිරි මහා සභාවට අනුමැතිය සඳහා ඉදිරිපත්කරනු ලබන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**04. වෙනත් ලේඛන ඃ-**

**(උ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**2022 වර්ෂයේ පෙබරවාරි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.**

නළ ජලය ලබා දීම සඳහා නරාවල වැවේ වත්ත මාර්ගය අවිධිමත් ලෙස පළුදු කිරීම සම්බන්ධව පසුගිය සභා වාරයේදී තමා විසින් අදහස් පළ කළ බවත්, ඒදින තමා නිවසට යාමට පෙර එම පිරිස පැමිණ තමාව හමුවී ඒ සම්බන්ධව අප්‍රසාදය පළ කළ බවත්, සභාවට අයිති මාර්ගයක් අවිධිමත් ලෙස පළුදු කිරීම සම්බන්ධව තමා විසින් පළ කළ අදහස් අදාළ පාර්ශවයට දැනුම් දුන් අය පිළිබඳව තමා දැනුවත් බවත්, මෙම මාර්ගය පළුදු කිරීම නිසා සභාවට රුපියල් ලක්ෂයකට අධික පාඩුවක් සිදු වී ඇති බවත්, තමා නිතර ගමන් කරන මාර්ගයක් වන මෙම මාර්ගයට හානි කිරීම පිළිබඳ සිද්ධිය යට නොගසා මාර්ගයට සිදු වූ හානිය තක්සේරු කොට අයකර ගැනීමට කටයුතු කරන ලෙසත්, මෙය වැරදි ආදර්ශයක් බැවින්, මෙවන් කටයුතු බලප්‍රදේශය තුළ නැවත සිදු නොවීමට වග බලා ගත යුතු බවත් ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම මාර්ගය අවිධිමත් ලෙස පළුදු කර ඇති බවට තාක්ෂණ නිලධාරිතුමිය විසින්ද තමාව දැනුවත් කළ බවත්, එම සිදුවීම ජල සම්පාදන මණ්ඩලයේ වරදක් බවත්, එම වරද නිවැරදි කිරීම සඳහා තමා විසින් පෞද්ගලික අවධානය යොමු කොට ඇති බවත්, මේ සම්බන්ධව ගනු ලැබූ ක්‍රියාමාර්ග ඊළඟ සභා වාරයේදී සභාවට දැනුම් දීමට කටයුතු කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

වැලිකැටිය වත්ත මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීම පිළිබඳව ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

නව රේට්ස් පැමිණ ඇති බැවින්, ඒ පිළිබඳව සළකා බලා මේ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

තමාගේ අතපසුවීමක් නිසා මෙම සභා වාරයට යෝජනා ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවත්, මීට පෙර සභා වාරවලදී තමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවලට අදාළ තොරතුරු සභාගත කරන ලෙසත්, ගරු සභාපතිතුමාගේ කොට්ඨාශය වන හපුගල කොට්ඨාශයේ අනවසර ඉදිකිරීම් සිදු කොට ඇති බවත්, මේ වන විට දහනායක හාඩ්වෙයාර් එක තට්ටු තුනක් දක්වා අනවසරයෙන් ඉදිකොට ඇති බවත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

දහනායක හාඩ්වෙයාර් එක සඳහා මේ වන විට අධිකරණයේ නඩු පවරා ඇති බවත්, ඒ සඳහා ගොඩනැගිලි අයදුම්පත්‍රයක් සභාවට භාර දී ඇති බවත්, මාර්ගයේ සිට අඩි 50 සීමාව තබා ගොඩනැගිල්ලේ අවශ්‍ය කොටස් කඩා සැලසුම අනුමත කර ගැනීමට දහනායක හාඩ්වෙයාර්හි හිමිකරු විසින් බලාපොරොත්තු වන බවත්, මේ සඳහා ගොවිජන සේවා ආයතනයේ නිර්දේශ ලබා ගත යුතු බවටත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

හපුගල ග්‍රෑන්ඩ් පැනරෝමා වෙන්දේසි ඉඩමේ තට්ටු තුනක නිවසක් අනතුරුදායක ලෙස ඉදිකර ඇති බවත්, ඊට ආසන්න ඉඩමේද නව නිවසක් අනතුරුදායක ලෙස ඉදිකෙරෙමින් පවතින බවත්, මෙම ඉඩම පිහිටා ඇත්තේ සභාවට අයිතිය ඇති පොදු ඉඩම ආසන්නයේ බවත්, එම ඉඩම මායිමේ අවිධිමත් ලෙස පැති බැම්මක් ඉදිකොට ඇති බවත්, ඉඩමේ වතුර බැසයන ආකාරය පිළිබඳව අවධානය යොමු කොට නැති බවත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(පෙ.ව 11.55ට ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රී කාංචනා මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

එම නිවස එන්.බී.ආර්.ඕ ආයතනයෙන් අනුමත කර ඇති බවත්, එම සැලැස්ම අනුව නිවසේ ඉදිකිරීම් කටයුතු සිදු කොට ඇති බවත්, පැති බැම්ම සඳහාද අනුමැතියට ඉදිරිපත් කොට ඇති බවත්, ඒ සඳහා එන්.බී.ආර්.ඕ ආයතනයෙන් නිර්දේශ ලබා ගන්නා ලෙස දැනුම් දී ඇති බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

පියසේන මහතාගේ ගැටළුව පිළිබඳව වර්ෂා කාලයේදී පමණක් කතා කරන බවත්, අනවසර ඉදිකිරීම් පිළිබඳව සභාවට වගකීමක් ඇති බවත්, මෙම ගැටළුව නිසා මෙම පුද්ගලයා හට පීඩාකාරී තත්ත්වයක් ඇති බවත්, එම කාණුව සකස් කර දී ජනතාව පීඩාවට පත්වීම වළක්වන ලෙසත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ප්‍රශ්නයට අදාළ පුද්ගලයාගේ සහෝදරයා විසින් මෙම ඉඩම විකුණා ඇති බවත්, මෙම ඉඩම ගොඩකිරීම සම්බන්ධ ගැටළුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හරහා විසඳාගත යුතු බවත්, මෙම ගැටළුව අවම කිරීම සඳහා මාර්ගය අයිනෙන් දිගට කාණුවක් කැපීම පමණක් සභාව ලෙස සිදු කළ හැකි බවත්, අනවසර ගොඩකිරීම් ඉවත් කළ හැක්කේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පමණක් බවත්, එහි ඇත්තේ පෞද්ගලික ආරවුලක් බවත්, එම ඉඩමට මායිම්ව ස්වාභාවිකව පිහිටි කාණුවක් ඇති බවත්, සභාව විසින් කපන ලද කාණුව එම කාණුවට සම්බන්ධ කළ විට වතුර බැස ගිය බවත්, සභාව විසින් කපන ලද කාණුව ස්වාභාවිකව පිහිටි කාණුවට සම්බන්ධ කිරීමෙන් මෙම ගැටළුව විසඳාගත හැකි බවත්, මෙම ස්වභාවිකව පිහිටි කාණුව වැසීමට අවට ප්‍රදේශවාසීන් සමග එක්ව මෙම පුද්ගලයන් විසින් කටයුතු කරන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම මාර්ගයේ අවසානයේ කුඹුරක් පැවති බැවින්, එම කුඹුර හරහා ජලය ගලා ගිය බවත්, මේ වන විට එම කුඹුර ගොඩකර ඇති බවත්, එම නිසා මෙම ප්‍රදේශයේ ඇති වතුර බැස යාම සඳහා කාණුවක් සකස් කළ යුතු බවත් ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තම නිවස ආසන්නයේ ඇති ඉඩමක මදුරුවන් බෝ වීමේ ගැටළුවක් ඇති බවත්, එම ඉඩම ගොඩකිරීමේදී පහත්බිම් ගොඩකිරීමේ මණ්ඩලය විසින් සභාවේ නිර්දේශ ලබා ගන්නා ලෙස දන්වා ඇති බවත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම ගොඩකිරීම සඳහා පහත් බිම් ගොඩකිරීමේ මණ්ඩලයෙන් අනුකූලතා සහතිකයක් ලබා ගෙන ඇති බවට, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, වසර දෙකක පමණ කාලයක සිට මෙම ගැටළුව ඇති බැවින්, මේ සම්බන්ධව තීන්දු ගැනීමේදී සභාව දැනුවත් කර තීන්දු ගන්නා ලෙසත්, මෙම ගැටළුව සඳහා කඩිනමින් විසඳුමක් ලබා දිය යුතු බවත්, සභාවේ අනුමැතිය ඇතුව තුන්හිරිපාන ප්‍රදේශයේ ඉඩමක් වෙන්දේසි කොට ඇති බවත්, ඒ සම්බන්ධව ඇති ගැටළු නිරාකරණය කරන ලෙසත්, ජේ.සී.බී. යන්ත්‍රය යෙදවීම සභා තීරණ අනුව පමණක් සිදු කරන ලෙසත්, ගංවතුර වැනි හදිසි ආපදා කටයුතුවලදී පමණක් එසේ සිදු කිරීම අනවශ්‍ය බවත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගුණසේකර තාක්ෂණ නිලධාරි මහතාගේ ස්ථානමාරුව සම්බන්ධව ගරු මන්ත්‍රීවරු කිහිපදෙනෙකු අත්සන් කොට විශේෂ යෝජනාවක් ලබා දුන් බවට, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ සම්බන්ධව, තමා විසින් අදාළ ලිපිය යොමු කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කලුවගහ අද්දර ඉඩමේ ඇති ගැටළුව විසඳන ලෙසත්, මුල් ඉඩමේ සැලැස්ම අනුමත නොකර කැබලි කරන ලද ඉඩම් අනුමත කිරීම නිසා මිනිසුන් අපහසුතාවයට පත්ව ඇති බවට, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ඉඩමේ මේ වන විට මිනිසුන් විසින් ගෙවල් සාදාගෙන පදිංචිවීමද සිදු කොට ඇති බවත්, ඒ සඳහා අවුරුදු 10 ක පමණ කාලයක් ගතව ඇති බවත්, මෙම ගැටළුව සම්බන්ධව සැලසුම් කමිටුව විසින් විශේෂ

තීරණයක් ලබා ගෙන ඇති බවත්, පාර සඳහා අඩි 05 ක ඉඩක් තැබීමටත් 10% ක මුදලක් සභාවට ගෙවීමටත් එම තීරණය ලබා ගෙන ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ඒ සඳහා මාර්ගය ආසන්නයේ ඇති නිවාස දෙකෙහි හිමිකරුවන් විසින් අකමැති බවත්, තාප්ප කඩා පාරවල් පළල් කිරීමට මිනිසුන් ඉඩ ලබා නොදෙන බවත්, එම ඉඩමේ කැබලි දෙකක් පමණක් අනුමත කොට ඇති බවත්, මාර්ගයේ පහළ කොටසේ ඇති සර්කල් එක අවහිර කර ඇති බවත්, මේ නිසා අඩි විස්සක් පළල ඇති මාර්ගයේ වාහන නිවෙස් වෙත ගමන් කරන්නේ රිවස් එකට බවත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම අවහිරතා සහා තීරණයක් ලබා ගෙන ඉවත් කරන බවත්, මාර්ගයේ ඇති සර්කල් එක අවහිර වන පරිදි ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

පසුගිය සභා වාරයකදී තමා විසින් මේ සඳහා යෝජනාවක් ඉදිරිපත් කොට ඇති බවත්, මෙම ගැටළුව නිසා පහළ ඉඩමේ පදිංචි පුද්ගලයාගේ නිවස වර්ෂා දිනවලදී ජලයෙන් යටවීම සිදු වන බවත්, මෙම ගැටළු නිරාකරණය කර ගන්නා තෙක් කළුවගහ අද්දර ඉඩමේ කැබලි අනුමත නොකළ යුතු බවටත් ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමාහට සහ ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය හට අද දිනයේදී මහා සභා රැස්වීම සඳහා සහභාගිවීමට නොහැකි බවට දැනුවත් කොට ඇති බැවින් ඔවුන් දෙදෙනා හට නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු</u> :-**

01. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
02. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2022-03-16 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීමේ කටයුතු ප.ව 12.00ට අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.